**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - 2015**

**-----------------------------------------------------**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1982 අංක 09 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනතේ 21 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03**

2013 හා 2014 වර්ෂයන්ට අදාළව සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ වටිනාකම පිළිවෙලින් රු. 9,124,036 ක් හා රු.17,942,843 ක් වූ උපදේශන ගාස්තු ප්‍රමිතයේ ප්‍රකාරව අතීතානුයෝගීව ගැලපීම් සිදු නොකර සමාලෝචිත වර්ෂයේ ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.93,773,720 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පිහන් භාණ්ඩ මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.1,015,270 ක් අත්තිකාරම් යටතේ දැක්වීම වෙනුවට අදාළ භාණ්ඩ ලැබී නොතිබියදී මූල්‍ය ප්‍රකාශනවල පාරිභෝගික භාණ්ඩ යටතේ දක්වා තිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතු වටිනාකම රු. 27,656,085 ක් වූ ණයගැතියන් සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 හා 2011 වර්ෂවල සිට පුහුණු වැඩසටහන්වලට අදාළව අමාත්‍යාංශයකින් හා ආයතන කිහිපයකින් අයවිය යුතුව තිබුණු රු.13,339,159 ක් අය කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) පනතේ 13(2) වගන්තියේ විධිවිධාන අනුව ද්විතියනය පදනම මත සේවය කරන නිලධාරීන් රජයේ සේවයේ වැටුප් රහිත නිළධාරීන් බැවින් ආයතනයෙන් ඉවත්ව යාමේදී ණය ශේෂ පියවිය යුතු වුවද සේවයෙන් ඉවත් වූ නිලධාරීන් 04 දෙනෙකුගෙන් වර්ෂ 01 ත් වර්ෂ 03 ත් අතර කාල පරාසයක සිට අයවිය යුතු රු.418,527 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) උපදේශන පාඨමාලාවල දේශන පැවැත්වූ සම්බන්ධීකාරකවරුන් විසින් දේශන පැවැත්වීමෙන් පසු ඉදිරිපත් කළ යුතු වාර්තාව නියමිත වේලාවට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ගෙවිය යුතු ගාස්තු රු.147,705,928 ක් විය. ඉන් එකතුව රු. 2,903,080 ක ශේෂ වසර 5 ඉක්මවා තිබූ අතර, එකතුව රු.40,488,585 ක ශේෂ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර විය.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1982 අංක 9 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනතේ 3 වන වගන්තිය | ආයතනයේ අරමුණුවලට පටහැනිව අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත බාහිර ආයතනවල තනතුරුවලට බඳවා ගැනීමේ විභාග පැවැත්වීමට කටයුතු කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 571 | 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ඉක්මවා තිබූ රු. 2,958,396 ක රැඳවුම් මුදල් සහ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2015 ජුනි 26 දිනැති අංක 18/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධාරීන් සඳහා පමණක් විශේෂ දීමනා ගෙවීමට අනුමැතිය ලබා දී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ ජුලි සිට දෙසැම්බර් මාසය දක්වා ආයතනයේ විධායක නිලධාරීන් 11 දෙනෙකු සඳහා රු. 701,903 ක් ගෙවා තිබුණි. |
| (ඇ) | 2015 සැප්තැම්බර් 17 දිනැති අංක එච්ආර්/එෆ්ටීආර්/එම්කිව්යු/12/15 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් (වැඩබලන) ගේ ලිපිය | විදේශ සංචාරය අවසන් වී දිවයිනට පැමිණ මාසයක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් නිලධාරීන් 08 දෙනෙක් විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ද්විතීයනය දීමනා වශයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයට වැටුපෙන් සියයට 50 ක් ගෙවීමට 2013 අප්‍රේල් 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබාදී ඇතත් එම අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ආවරණය නොවන ද්විතීයනය පදනම මත අනධ්‍යයන සේවාවල නිරතව සිටින මාණ්ඩලික නිලධාරීන් 10 දෙනෙකු සඳහා 2014 අප්‍රේල් 23 දිනැති අංක එස්/ඒඩී/1/3/11 දරන අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුපෙන් සියයට 50 ක් වශයෙන් රු.2,516,398 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) විදේශ පුහුණු වැඩසටහන් 02 කට සහභාගී වූ නිලධාරීන් 60 දෙනෙකු වෙනුවෙන් එම නිලධාරීන් සේවය කරන ආයතනවලින් වැඩසටහන්වල වියදම් සඳහා රු.15,817,483 ක් ලැබී තිබූ අතර ආහාර, නවාතැන්, පාඨමාලා ගාස්තු සඳහා රු.11,636,733 ක් පමණක් වැය වී තිබුණි. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක 01/2010/01 හා 01/2015/1 දරන චක්‍රලේඛවලට පටහැනිව ඉතිරි මුදල වූ රු. 4,180,750 ක් අදාල ආයතනවලට ආපසු නොගෙවා නිලධාරීන්ට ගෙවීමට කටයුතු කර තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට ලැබිය යුතු නේවාසිකාගාර ගාස්තු ලෙස ගිණුම් ගත කර තිබූ රු.633,150 ක් විධිමත් අනුමැතියක් නොමැතිව කපාහැර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 9,798,215 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 34,195,260 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ඌනතාවය රු. 24,397,045 කින් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මුළු වියදම රු.27,665,948 කින් වැඩි වුවද, පුනරාවර්තන ප්‍රදාන රු.6,974,765 කින් හා අනිකුත් ආදායම් රු. 45,088,229 කින් වැඩිවීම ඌනතාවය අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. එසේ වුවද අනිකුත් ආදායම්වල වැඩිවීම කෙරෙහි බොල් ණය අධි ප්‍රතිපාදනය රු.12,028,934 ක් ගැලපීම හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2011 වර්ෂයේදී රු.640,761 ක් වූ අතිරික්තය 2012 වර්ෂයේදී රු.14,875,471 ක ඌනතාවයක් බවට පරිවර්තනය වී සමාලෝචිත වර්ෂයේදී රු. 9,798,215 ක් දක්වා අඩුවී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැළකීමේදී 2013 වර්ෂයේදී රු.69,040,146 ක් වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු. 125,405,149 ක් වී තිබුණි.

**4 මෙහෙයුම් සමාලෝචනය**

-------------------------

**4.1 කාර්යසාධනය**

--------------

1982 අංක 09 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව ආයතනයේ ප්‍රධාන අරමුණු පහත දැක්වේ.

(i) රාජ්‍ය නිලධාරීන්ගේ නිල කාර්යය ඵලදායී ලෙස ඉටුකිරීමට අවශ්‍ය වන අවබෝධය, කෞශල්‍යය හා හැසිරීම පුහුණුව මගින් වර්ධනය කිරීම.

(ii) කළමනාකරණ හා රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයන්හි පුහුණු කිරීමේ පාඨමාලා සංවිධානය කිරීම, පාඨමාලාවට සම්බන්ධ සහතික පත්‍ර හා ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.

(iii) රාජ්‍ය සේවය මුළුල්ලේ කාර්යක්ෂම හා ඵලදායී පරිපාලනය සහතික කිරීම පිණිස අධීක්ෂණ හා ආධාර කාර්ය මණ්ඩල වර්ධනය කිරීම.

(iv) කළමනාකරණය පිළිබඳ විවිධ කර්තව්‍ය ක්ෂේත්‍රයන්හි උපදෙස් ලබාගැනීම, අදහස් විමසීම සහ විශේෂ පැවරීම් සඳහා විශේෂඥයන්ගේ සේවාවන් ලබාගැනීමට සැලැස්වීම.

(v) රාජ්‍ය අංශයේ ආයතනවලට සංවිධානාත්මක කළමනාකරණ ක්‍රම නැවත සලකා බැලීමට හා වැඩිදියුණු කිරීමට සහාය වීම, ආයතන කටයුතු ,ප්‍රතිමාන, වන්දි ගෙවීමේ ක්‍රම නිශ්චය කිරීම ආදිය සම්බන්ධයෙන් එම ආයතනවලට සහාය දීම සහ ඒවායේ ඵලදාව වැඩිදියුණු කිරීම.

(vi) ශ්‍රී ලංකාවේ සහ විදේශවල කළමනාකරණ පුහුණු කිරීම, පර්යේෂණ පැවැත්වීම සම්බන්ධ කටයුතුවලදී අන්‍ය සංවිධානයන් සමූහයක් සහ පුද්ගලයන් සමග උද්යෝගීව සහයෝගයෙන් කටයුතු කිරීම.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව සිදු කරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) **උපදේශන වැඩසටහන්**

**-----------------------**

ආයතනයේ සේවය කරන උපදේශකවරයෙකු විසින් මාසිකව ගාස්තු අයනොකරන අවම දේශන පැය 45 ක් ආවරණය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවසන් හය මාසය තුළදී උපදේශකවරු 13 දෙනෙකු විසින් ආවරණය කලයුතු අවම දේශන පැය 797ක් ආවරණය කර නොතිබුණි. ඒ වෙනුවෙන් ගෙවූ ගාස්තු රු.713,300 ක් අයකරගත යුතුව තිබුණ ද ඉන් රු.369,045 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ අනුව මාසිකව ආවරණය කළ යුතු දේශන පැය ගණන ආවරණය කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් පුහුණු හා උපදේශන වැඩසටහන් බාහිර දේශකවරුන්ගෙන් ඉටුකරගෙන සමාලෝචිත වර්ෂය තුළදී දේශන පැය 2131 ක් සඳහා රු.2,633,750 ක් ගෙවා තිබුණි.

(ආ) **පුහුණු කටයුතු**

**---------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඩිප්ලෝමා පාඨමාලාව සඳහා වාර්ෂිකව තෝරා ගන්නා ලද සංඛ්‍යාව 2012 වර්ෂයේ දී 628 ක් වූ අතර 2015 වර්ෂය වන විට එය 288 ක් දක්වා අඩු වී තිබුණි. එසේ වුවද පාඨමාලා හැරයන සංඛ්‍යාව 2012 වර්ෂයේ සියයට 16 ක් වුවද, එය 2015 වර්ෂය වන විට සියයට 26 ක් දක්වා වර්ධනය වී තිබුණි.

(ii) කළමනාකරණ හා කළමනාකරණ නොවන සහතික පත්‍ර පාඨමාලාවන්හි හැරයාමේ ප්‍රතිශතය පසුගිය වර්ෂයට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කළ අතර එය සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් සියයට 62 ක් හා සියයට 47 ක් විය.

පුහුණු පාඨමාලා හැරයාමට හේතු වී ඇති කරුණු ආයතනයේ විෂය පථයෙන් පරිබාහිර කරුණු බව අධ්‍යක්ෂ ජනරාල් විසින් අදහස් දක්වා තිබුණි

**4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ ප්‍රාග්ධන ප්‍රදාන ආරම්භක ශේෂය රු.42,805,432 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන වලින්ද සියයට 50 ටත් වඩා අඩු මුදලක් එනම්, රු. 51,549,835 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව වර්ෂය අවසානයට ඉතිරි වී තිබූ ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය රු.96,050,096 ක් විය.

(ආ) මුදල් අමාත්‍යවරයාගේ සහ අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව ප්‍රාග්ධන ශේෂය හා ආයතනයේ ක්‍රියාකාරීත්වය තුළින් ජනිත වූ මුදල් ශේෂයක් ද ඇතුළත්ව 2016 වර්ෂයේදී ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබූ රු.100,000,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන ලෙස දක්වා තිබුණි.

**4.3 දෘශ්‍ය අක්‍රමිකතා**

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ මූල්‍ය කළමනාකරුවන් සඳහා මහා බ්‍රිතාන්‍යයේ පැවති ධාරිතා සංවර්ධන වැඩසටහනක් සඳහා 2015 ජූනි 21 දින සිට 2015 ජූලි 02 දින දක්වා දින 11 ක් නිලධාරීන් 22 දෙනෙකු සහභාගී වී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2015 මැයි 15 දිනැති අංක එම්එෆ් 01/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව විදේශගතවන නිලධාරීන්ට හිමි සම්පූර්ණ සංයුක්ත දීමනාව හා අනියම් දීමනාව වශයෙන් රු.18,899,159 ක් එම නිලධාරීන් සේවය කරන ආයතනවලින් ලබාගෙන එයින් රු. 6,191,691 ක් පාඨමාලා ගාස්තු , ගුවන් ප්‍රවේශ පත්‍ර සහ සිහිවටන සඳහා ගෙවීම් කර තිබුණි. ඉතිරි රු.12,707,486 ක් මුදල එක් නිලධාරියෙකුට රු. 577,612 බැගින් බෙදා දීමට කටයුතු කර තිබුණි.

(ii) 2003 ඔක්තෝබර් 28 දිනැති අංක පීඊඩී /17 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන් දේශීය අරමුදලින් කරන විදේශ ගමන් සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය සති දෙකකට පෙර ලබා ගත යුතු වුවත් මෙම චාරිකාවට සහභාගී වූ ආයතනයේ නිලධාරීන් දෙදෙනා සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**4.4 හඳුනාගන්නා ලද පාඩු**

-----------------------

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක නිසි පරිදි පවරා නොගෙන පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීමට බිම් සකස් කිරීමේ කටයුතු සඳහා පසුගිය වර්ෂයේදී කරන ලද වියදම් රු.2,062,325 ක් කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණද, මෙම ඉදිකිරීම සඳහා සම්බන්ධිත ආයතන අනුමැතිය නොලැබීම මත ඉදිකිරීම නවතා දමා තිබුණි. එබැවින් එකී මුදලින් ආයතනයට පාඩුවක් සිදු වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ලාභයෙන් එම වියදම කපා හැරීමට කටයුතු කර තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කාර්ය මණ්ඩලය 162 ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 110 ක් විය. ඉන් තනතුරු 52 ක්ම පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) 2013 අප්‍රේල් 19 දිනැති අංක අමප/13/0237/523/011 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ද්විතීයනය පදනම මත බඳවා ගැනීමේදී ප්‍රසිද්ධ දැන්වීම් මගින් ඉල්ලුම්පත් කැඳවා ආයතනයේ පාලක මණ්ඩලයේ සියළුම සාමාජිකයන්ගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුස්සන් තෝරා ගැනීමට කටයුතු කළ යුතු වුවත්, බඳවා ගෙන තිබූ මාණ්ඩලික තනතුරු 10 ක් හා මාණ්ඩලික නොවන තනතුරු 08 ක් සම්බන්ධයෙන් එම ක්‍රියාමාර්ගය අනුගමනය කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කිරීම

----------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණු අතර, මූල්‍ය ප්‍රකාශන දින 174 ක් ප්‍රමාද වී 2016 අගෝස්තු 22 දින ඉදිරිපත් කර තිබුණි. විගණනය විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2017 ජනවාරි 03 දින ඉදිරිපත් කර තිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

----------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක වන නමුත් ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ එක් නිලධාරිනියක පමණක් සේවයේ යොදවා තිබුණු බැවින් ආයතනයේ සමස්ත කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු නොවන බවත්, වාර්ෂික විගණන සැලැස්ම අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වී නොමැති බවත් නිරීක්ෂණය විය.

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(අ) මාර්ගෝපදේශය අනුව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මේ වායු සමීකරණ යන්ත්‍ර 07 ක් මිලදී ගැනීම සඳහා රු.1,700,000 ක් වියදම් කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී වායු සමීකරණ යන්ත්‍ර 34 ක් රු.7,532,369 ක් වැයකර මිලදී ගැනීම හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්ම අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව පිළියෙල කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 සහ 5.2.5 වගන්ති අනුව කෙටුම්පත් අයවැය ලේඛනය ගිණුම් වර්ෂය ආරම්භ වීමට මාස 3 කට පෙර පාලක මණ්ඩලය වෙත සහ ගිණුම් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණේ 2015 පෙබරවාරි 15 දින දීය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර සියයට 27 සිට සියයට 1760 ක් දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය අනුව වාර්ෂික වාර්තා ගිණුම් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2013 සහ 2014 වර්ෂවල වාර්ෂික වාර්තා පිළියෙල කර සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ණයගැති හා ණයහිමි පාලනය | ලැබිය යුතු හා ගෙවිය යුතු වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ආ) ඉන්වෙන්ට්‍රි පාලනය | විධිමත් ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන නොතිබීම. |
| (ඇ) විභාග පැවැත්වීම | විභාග අංශයේ විනිවිදභාවය සහ රහස්‍යභාවය ආරක්ෂා වන පරිදි එම අංශය සකස් කර නොතිබීම. |

| | | |
|---|---|---|
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | භාණ්ඩ ලැබීම් පත්‍ර නිකුත් කර නිසි පරිදි පොත්වලට ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඉ) | ගෙවිය යුතු උපදේශන ගාස්තු | වර්ෂයට අදාළ උපදේශන ගාස්තු සම්බන්ධයෙන් වූ ගෙවීම් ප්‍රවර්තන වර්ෂය තුළදී නිරවුල් කිරීමට ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබීම. |